


අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව
www.ketapathpawra.com




සියොළඟ දවන උණුසුම් සුළඟකි හැමුවේ
සර සර හඬිනි මහරුක් අතු ඉති සැලුවේ
අකුණක සැරය විහිදුණි වියලුණු දළුවේ
මහ වන පෙතම බියකරු සුසුමකි හෙළුවේ

අතු අග රඟන ලේ රතු පැහැ ගිනි දළුය
වියරුව හමන සුළඟෙන් ගෙන යන අළුය
සැණෙකින් නැගී නුබ විසිරෙන දුම කළුය
දසතම වැසේ ලෙස වන මැද ගල් කුළුය

සර සර හඬින් වන සිරි වැනසෙන සරිය
සිරි සැප දුන් වනය සිර ගෙය වූ සරිය
දරු මල් වැළඳ බව බෝ සිත අත හැරිය
සැරසුණි පලා යන්නට සිත ගෙන දිරිය

බුරා නැගෙන රතු ගිනි දැල් දස අතින
ගරා වැටෙන ගේ දොර සඟවා නෙතින
දරා නොහෙන සිතුවිළි පුරවා සිතින
පරා ජය රැගෙන නික්මිණි දැඩි සිතින

පසල් දනව්වක මතු වුණු ලැව් ගිනිය
නිසල් ගුවන කම්පිත බිහිසුණු ගිනිය
විසල් නුවර දන හැම ලය සෝ ගිනිය
තුමුල් මිනිස් දිවි බිළි ගත් ලැව් ගිනිය

පාලිත ගනේවත්ත

## සීත රැයක

ඔබේ මදහාසය
දැස් අභියස පෙනි පෙනී
සුහදේ එන්නද
ඔහේ පා වි පා වී
අමුණමි කඳුළු කැට කැට
මේ පහන් රැ යේ
රැළි රැළි සුසුම් පාවෙයි
මේ සීත රැයේ

-නිල්මිණි-

## සොබා දහමට එරෙහිව

දැකුම් කළු කඳු වැටි තැනිතලා අතරින් ගලා බසිනා
සොඳුරු නදියක ඉවුරු දෙපසෙහි තිබෙන ගස්වැල් සොඳුරු දසුනා
සොබාදම් දිනිතියගෙ විස්මය බැලූ බැලූ අත සැමට පෙණුනා
එම සොබා දහමම රුදුරු බව ලැව්ගිනි වලින් අපට දැණුනා

තුරු ලතා වල සිරි බලන්නට වර්බටන් වෙත ගියා මතක ද
මෙරිස්විල් වල කුඩා කඳුවැටි සිරිලකට සම කළා මතක ද
හිම බලන්නට යද්දි කඳුරට දැකපු මනරම් දසුන් මතක ද
මේ සියළු දෙය අසුරු සැණකින් දැවී අළු වී ගියා ගිනි මැද

තම තමන්හට වාසි වන ලෙස සොබා දහමට එරෙහි වන්නට
යොමු වෙලා ඇති මිනිස්වග නොදනී සොබාදම් මෑණියගෙ වග
ඇය කිපුණ විට නවත්වන්නට නොහැකි වග මිනිසුන්ට කිසි විට
පසක් කරගෙන දිවි ගෙවිය යුතු වේය මෙම දියතෙහි මිනිස් වග

ගාමිණී ලක්ෂ්මන් ගමගේ

## තුූපන් කවිය

'වන්නියේ මානුෂික මෙහෙයුමේදී
මේලෙව්ව ලෙස ඝාතනය වුනු
ගැබිනි මවකගේ ඡායාරූපයක් දැකීමෙන්'

ඇස් ඇරලවත් නැති
කුරුළු පැටියෙක්
මව් ගැබ තුලම
මස් වැද්දන්ට
ගොදුරුවිණි.
පිපිරී
කැබලි වෙන්වුනු
වැදෑමහ ඉහලින්
නොඉඳුල් පියාපතක්
ලේ තැවරී මතුවිණි.

සිඟිති තොල් මත දොවන්නට
පුපුරුගසමින් බලාසිටි
තනපුඩු තුඩින්
කඳුලක හැඩැති කිරි බිඳු වැස්සිණි.
ලෙයට ලෙය මුහුවී
මව්කිරෙන් පැහැවී
කතා නොකරන
මහපොළොවද
සුසුම් ලා
ඉකිබිඳිනු ඇසිණි.

පුතු හීන දකින්නැති
කිරි හිනා මුවෙහි පිපෙන්නැති.
මව් හීන මවන්නැති
කිරි හිනා හෙමින් ඇහෙන්නැති.
මුරුගයින් ඇවිත්
හීන පුපුරුවන්නැති
මස්වැදලි මත
පෙඟී විසිරෙන්නැති.

තුඹව බිලිගත් වනසතුන්
කොල්ලකති
උපන් ගම්බිම්.
ඉවකරති
නිතර ලේ රහ දඩයම්.
ඉපදුනද
ජීවිතයක් කොහේවෙද
ඉගිල්ලෙන අහසත්
උන් අරන්.

නොහඬාම ඉන්නෙමි.
වන්නියට මට දුර වැඩියි. ඉවසමි.
නිසොල්මන්
සිඟිති පියාපත වෙත
හීනෙකින්
මගේ අත ළං කර
ඇඟිල්ලෙහි
එල්ලේදැයි
බලා ඉමි.



මහේෂ් මුණසිංහ
2009 03

## අර පරිස්සම

වැව් ඉවුරෙන් ජම්බුං ගාලා
දියට පැන්න මං
පැය ගානක් පීන පීන
වතුරෙ නෑව මං
ශීත වතුරෙ ගිමන් නිවපු මං

ඒ වුණාට දැන් ..

වීදුරු කූඩුවට වෙලා
යාන්තමට ඇඟ තෙමලා
විනාඩි හතරක් නාලා
එළියට එන මං..

අනේ අපොයි!!

කරුණාකර අසනු මැනවි
මේ දෙන ඔවදන්
අහසින් පොළොවට වැටෙනා
වැහි බිඳුවක් නොමැති නිසා
ඉතාම අර පරිස්සමෙන්
පරිහරණය දැන්..

දිය බිඳුවක බලගතුකම
හැමට දැනේ දැන්
වටිනාකම කෙතරම් දැයි
තේරුණාද දැන්..

ලක්ෂ්මී ගුණරත්න



## වල්මත්වූ වස්සානය

කුරුළු ගී අයෝමය
ගිනි වැදුනු අහස යට
වළාකුළු තිර ඉරී
විරාමය නැත ඇසට..
සිත සසල වෙයි නිතර
නොපැහැදිලි සිහිනයක
අදිසි හඬකින් දෙඩූ
රහසක්ද මේ රැයක.
නියං සායට වැටුන
කඳුළු සිසිලක මතක
දේදුන්න මෙන් නැගී
පායනා කල සිතක..
වස්සානයට පිපෙන
මල් අතර කහපාට
වසන්තේ මල් කිමද
පිපෙන්නේ ලේ පාට.

චන්ද්‍රිකා ද සිල්වා

## උණු ලේ...

සාලය පුරා
ලේ
ගලා යන
පුටු සැටි
මේස කැබිනට්ටු
කකුල් පොඟවමින

රූපවාහිනී යන්ත්‍රයෙන්
නිතිපතා ගලා එන
උණු ලේ...

ඊ ඒ ඩෝසන් ප්‍රීති

## ජනකවි

අහස මේඝ වැසි වතුර ගලා ගෙන
බීත කරන ගල් පහුරක් ඇද ගෙන
වාත සුළං සෙල් කඳු ගුගුරා ගෙන
වසවතු එයි තද මේඝ මවා ගෙන

මඳකුත් උෟ දෙස නොබලා වැඩ ඉඳ
ඉදිකටුවෙන් ආසන වට ඉරී ඇඳ
මුනිඳුගෙ අනුහස් බුදුරැස් පෑ තෙද
මුනි දැහැනෙන් ආසනයේ වැඩ ඉඳ

පුරාණ හිමගත වර්ණනාව




ඔබේ නිර්මාණ තව තවත් වර්ධනය කරගැනීමට වැඩි වැඩියෙන් කවි කියවන්න. වඩාත් හොඳ නිර්මාණ සොයා ගන්නට උත්සාහ කරන්න. ඔබ'තින් සාර්ථක නිර්මාණ බිහි වන්නට, එය ඔබට අත්වැලක් වනු ඇත.

සංස්කරණය
තුෂාරී ප්‍රියංගිකා

සන්නසට කවි එවිය යුතු විද්‍යුත් තැපෑල
sannasa@gmail.com

## ගිලන් ඇඳේ සිට

ඇඟ දවන රතු බිබිලි - ගත වසා පැතිරෙද්දී
නෙතු පියන් වැසී ගොස් - සිත ඔහේ නිදියද්දී
හද ගැහෙන රිද්මයට - යන්ත්‍රයෙන් පණ පොවද්දී
නිසලවම වැතිරිලා - මරණයේ දොර ළඟදී

සත් දිනක් පුරාවට - මරු සමඟ සටන් වැද
දෙනෙත් හැර බැලූ කළ - ළබැඳි සැම මගේ ළඟ
ඉවසන්න බැහැ වදන් - නොනැඟේය හඬ මුවින්
බට දිගේ මුව තුළින් - ගලා යයි ඔක්සිජන්

වේගයෙන් ඇවිද ගිය - දෙපා මට වාරු නැත
දෙඅත් මගෙ ඔසවන්න - ගතට සවියක් නොමැත
දරුපැටව් තුරුළු කර -- සිපගන්න වරම් නැත
දුරින් හිඳ බලනු මිස - ළං වෙන්න නොහැක මට

දිවා රෑ වෙහෙසෙමින් - මගේ දුක සැප බැලූ
දුකක් නොදැනෙන ලෙස -- දරු පැටව් රැක බැලූ
රකින්නට මගෙ දිවිය - නිරන්තර සෙත් පැතූ
සැමට මා ණයගැතියි - ජීවිතය ඇති තුරූ

කාන්ති ගලප්පත්ති
කැන්බරා

## නාමල් මිටක්

මළ හිරු බැස යන මොහොතක
සොහොන් කොතක් අභියස
සුදෝ සුදු වතින් සැරසී
දිගු කෙහෙ රැළි මුදා සිටි මා
ඔබ නෙත ගැටුණු බව
සොඳුරු මතකය අවදි කළ බව
තිස් වසරකට පසු
හදෙහි සැඟවූ රහස
කිම පැවසුවේ සබඳ?

දෙසිතම දෙතැනක නැතරවී ඇති සඳ
හිත ඇඳි පිලිරූ නොමැකේ නම්
මා නෙත් පියවුණු දිනයක
නොකිලිටි දෙරණ මත
දෝතින් නෙලූ නාමල් මිටක්
නොහෙලා කඳුලු බිඳක්
කියන්න අවසරයි
සබඳ

කාන්ති වික්‍රමසූරිය

## දාරක ස්නේහය
## හෙවත් සසර බැම්ම

මැදි වියෙත් හරි මැදයි දිවි ගෙවන්නේ මෙමා
සසර බැමි බිඳ හෙළන මග සොයන කළ සොඳා
අපිස් දිවියට මගේ ඇල්ම නැතුවා නොවේ
දිගු සසර ගමනටත් බියක් නැතුවා නොවේ

මේ සියළු සිතුවිලිත් සුනු විසුනු කර දමා
දරු සෙනේ බැමි බැඳේ පවුරු පදනම් දමා

අම්මගේ කෑම නම් හරිම රස යයි කියන
අනල කැව්වොතින් අපි තවත් කනවැයි කියන
මට මගේ දරු දෙපල සසර මග දිගු කරන
රැහැන් පොටවල් නොවෙද සිඳලන්න සිත නොදෙන

සුභාෂිනී හේරත්
ඇට්වුඩ්